**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2016**

**----------------------------------------------------------------------**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
----------------------------------------

2.2.1 ලැබිය යුතු ගිණුම්
-------------------

හිටපු සභාපතිවරයාගෙන් සභාවට අයවිය යුතු රු. 31,050 ක මුදලක් සහ එම සභාපතිවරයාට සභාවෙන් නිකුත් කර තිබූ රු. 40,112 ක් වටිනා භාණ්ඩ 2016 දෙසැම්බර් 31 දින වන විටද ආපසු ලබාගෙන නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 945,003 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,314,128 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,259,131 ක වර්ධනයක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාරය විසින් කරන ලද ප්‍රදාන රු. 4,193,487 ක් වැඩි වීම සහ විදේශීය පුහුණු වැඩසටහන් වලින් රු. 1,073,187 ක් ලාභ ඉපයීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2015 වර්ෂවලදී ඌනතාවන් ද අනෙකුත් වර්ෂවලදී මූල්‍ය අතිරික්තයන් ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ රු.8,838,045 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය වන විට රු. 21,728,153 ක් දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
------------------

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතෙහි 14(1) ඡේදය පරිදි රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය, විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම, ජීවන තත්ත්වය නංවාලීම, අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් (Disadvantaged group) සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම ඇතුළු ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ පිළිබඳ සොයා බලා එම ප්‍රතිපත්ති කලින් කල සමාලෝචනය කිරීම, එම වැඩසටහන් ක්‍රියාත්මකවීම සොයා බැලීම මූලික අරමුණු වේ. මෙම අරමුණු ඉටුකිරීම සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මානව සම්පත් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම හා අවාසිකර කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සොයා බැලීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී වැඩ සටහන් ක්‍රියාවේ යොදවා නොතිබුණි.

(ආ) පනත අනුව ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ වගකීම, සභාව වෙත පැවරී තිබුණද ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් අනුකාරක සභාව මගින් 2012 වර්ෂයේ සිට එය කම්කරු අමාත්‍යාංශය වෙත පවරා තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉලක්ක කළ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 වර්ෂය තුළ නිකුත් කිරීමට නියමිත වූ ශ්‍රී ලංකා රැකියා වෙළඳපොල උපනති පිළිබඳ වාර්තාව 2017 මාර්තු 31 දක්වා ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(ii) සංචාරක, ඇඟළුම් හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය වැඩමුළු 15 ක් පැවැත්වීමට රු. 1,500,000 ක් වෙන්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රු. 882,000 ක් වැය කරමින් සංචාරක ක්ෂේත්‍රය සඳහා වැඩමුළු 6 ක් පමණක් පවත්වා තිබුණි.

(iii) වර්ෂය තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා කළ ප්‍රතිපාදන වලින් සියයට 24 ක් වැයකර නොතිබූ අතර වැඩසටහන් 3 ක කාර්යසාධනය සියයට 10 සිට 57 දක්වා විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව පිහිටුවීමේ පනතේ විධිවිධාන අනුව මානව සම්පත් සංවර්ධනය කිරීම අදාල ප්‍රතිපත්ති උපනයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහභාගි වීම වෙනුවෙන් අමාත්‍යාංශ 11 ක ලේකම්වරු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, වෘත්තීය අධ්‍යාපන ආයතන 4 ක සභාපතිවරු හා අමාත්‍යාවරයා විසින් පත්කරන ක්ෂේත්‍රයේ ඉහළ පළපුරුද්දක් ඇති පුද්ගලයන් 5 දෙනෙකු ඇතුළු විද්වත් සාමාජිකයන් 20 දෙනෙකුගේ සමන්විත සභාවක් පත්කර, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 3 ක් පවත්වා තිබුණද, ප්‍රතිපත්ති උපනයනය කිරීමට හා ඒවා ප්‍රවර්ධනය කිරීමට අදාල තීරණ ගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පිරිවැය රු. 354,332 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 26 ක් භෞතිකව නොමැති බව පරීක්ෂණ කමිටු වාර්තාවක් අනුව නිරීක්ෂණය වී තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි ක්‍රියාකර නොතිබුණි.

4.3 විධිමත්ව පවරා නොගත් දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම

-----------------------------------------------------------------

බාහිර අමාත්‍යාංශයකට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා ඇති සභා කාර්යාලය නවීකරණය කිරීම සඳහා 2016 දෙසැම්බර් 30 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ රු. 8,916,745 ක වටිනාකමකට කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණද සභා කාර්යාලය දීර්ඝකාලීනව එම ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යාම සඳහා අදාල අමාත්‍යාංශය සමඟ විධිමත් ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව නවීකරණයේදී ඉවත් කරන භාණ්ඩ සඳහා රු. 25,000 ක ගාස්තුවක් අය කළද ඉවත් කිරීමට ගිවිසගත් සවිකිරීම් හඳුනාගෙන, ලැයිස්තු ගත කර, වටිනාකම් ඇස්තමේන්තු කර නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක්වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 05 ක් විය. කෙසේ වුවද සංස්ථාපිත පනතේ පුළුල් අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සභාව වෙත නොමැති බව නිරීක්ෂණය විය.

5 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණනය අංශය මගින් ද වර්ෂය තුළ කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2011 නොවැම්බර් 15 දින නිකුත් කර තිබූණු අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව ඇගයීම සඳහා අභ්‍යන්තර විගණනයක අවශ්‍යතාවය දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | වර්ෂය අවසානයේදී අයවැය ලේඛණය සංශෝධනය කර තිබීම. |
| (ආ) වත්කම් පාලනය | වත්කම් ඉවත් කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (ඇ) කාර්යසාධනය | පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම. |
| (ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ආයතන තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම. |